ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
පරිසර,වනජීවී,ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

# භූමිත් සංග්‍රහය

වෙළුම I ,නිකුතුව 1 | ජනවාරී 2020

# දස වසක අභිමන්

## ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනය කෙරේ.

දැනට පවතින ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය 2007 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කරන ලද අතර, එය කාලීනව සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත. එබැවින් , වනජීවී සංරක්ෂණ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යංශයේ මග පෙන්වීම මත ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමේ කාර්යය ආරම්භ කර ඇත. මේ සඳහා සියලුම පාර්ශවකාර ආයතනවල දායකත්වය ලබා ගැනීමට කටයුතු යොදා ඇති අතර, ඒ අනුව 2019 දෙසැම්බර් 17 දින අදාළ පාර්ශවකාර ආයතනවල අදහස් ලබා ගැනීමේ වැඩමුළුවක් රාජගිරිය, මහ බැංකු විද්‍යා පියසේදී පවත්වන ලදී.

6 පිටුවට......

## ඉඩම් පරිහරණ ගැටළු සම්බන්ධයෙන් සිදුකළ පර්යේෂණ එළි දැක්වේ.

දිස්ත්‍රික්කවල පවතින සුවිශේෂී ඉඩම් පරිහරණ ගැටළු පාදක කර ගනිමින් සිදු කරන ලද පර්යේෂණාත්මක අධ්‍යනයන් වලින් තෝරා ගත් අධ්‍යනයන් 20 ක් වාචික ඉදිරිපත් කිරීම් හා පෝස්ටර් ප්‍රදර්ශනයක් ලෙස 2019 සැප්තැම්බර් 19 දින කොළඹ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පැවති එක් දින ශාස්ත්‍රීය සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කරන ලදී. මෙම සම්මන්ත්‍රණය ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත් වයෙන් පැවති අතර, ඒ සඳහා විද්වතුන්, අනෙකුත් ආයතනවල නිලධාරීන් හා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් ඇතුළු නිලධාරීන් සහභාගී විය.

## 2018 භූමි පරිහරණ හා භූමි ආවරණ තොරතුරු ප්‍රකාශයට පත් කෙරේ.


ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව ජාතික වැඩසටහනක් ලෙස දිවයිනේ භූමි පරිහරණ තොරතුරු යාවත්කාලීන කිරීමේ වැඩසටහනක් 2016 වර්ෂයේදී ආරම්භ කළ අතර, ඒ අනුව ලංකාවේ සියලුම දිස්ත්‍රික්කවල භූමි පරිහරණ/භූමි ආවරණ තොරතුරු යාවත්කාලීන කරන ලදී. මේ සඳහා වසර 03 ක පමණ කාලයක් ගත වූ අතර, මෙම කාර්යය සඳහා මූලික සිතියම් මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන ලදී. එලෙස සිදු කල සමීක්ෂණයේ තොරතුරු සෑම දිස්ත්‍රික්කයක් ම ආවරණය වන ලෙස එම දිස්ත්‍රික්කවල භූමි පරිහරණ හා භූමි ආවරණ දත්ත සහ සිතියම් ඇතුළත් ප්‍රකාශනයක් ලෙස 2019 වර්ෂයේදී එළි දක්වන ලදී. 6 පිටුවට .......



ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සංශෝධනය කිරීමේ වැඩමුළුව.



ශාස්ත්‍රීය සම්මන්ත්‍රණයේ අවස්ථාවක්



භූමි පරිහරණ හා භූමි ආවරණ දත්ත පොත

මෙම කලාපයෙහි අඩංගු දෑ : දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා ඉදිරි සැලසුම් , ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ දස වසරක පිය සටහන් , Contribution of Land use policy planning Department for sustainable Development Goals , காணி உபயோகக் கொள்கைத் திட்டமிடல் திணைக்களம் கடந்து வந்த பாதை,

**මග පෙන්වීම හා අධීක්ෂණය:**

ඒ.එස්.ඉලන්ගම්ගේ-අධ්‍යක්ෂ ජනරාල්

**සංස්කාරක මණ්ඩලය :**

- බී.ඒ. ජයනන්ද - අධ්‍යක්ෂ/(ඉ.ප.සැ)
- ඩබ්.එම්. ප්‍රියන්ති -නියෝජ්‍ය අධ්‍යක්ෂ/(තො.පද්ධති)
- එම්.කිරුපාමූර්ති - නියෝජ්‍ය අධ්‍යක්ෂ/(ශෂ්‍ය විද්‍යා)
- ඩබ්.එම්.විතසිංහ- නියෝජ්‍ය අධ්‍යක්ෂ/(සමාජ විද්‍යා)
- එච්.ඩී.සිසිර-සහකාර අධ්‍යක්ෂ/(කෘෂි ආර්ථික විද්‍යා)

**පිටු සැකැස්ම හා පිට කවරය :**

- ජේ.එච්.එම්.එස්.එස්.කේ ජයපත්ම/සංවර්ධන නිලධාරි

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

31,පතිබා පාර ,

නාරාහේන්පිට,

කොළඹ 05.



**Tel: +94 112 500 338**
**Fax: +94 112 368 718**
**Email: landuseweb@gmail.com**
**Website: http://luppd.gov.lk/**






## දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය හා ඉදිරි සැලසුම්......

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ අවකාශීය සැලසුම්කරණය සිදු කරනු ලබන ආයතන කිහිපය අතුරින් ප්‍රමුඛ ආයතනයකි. මෙම ආයතනය දෙපාර්තමේන්තුවක් ලෙස උත්ශ්‍රේණි ගත කර 2020 වර්ෂයට දස අවුරුද්දක් සම්පූර්ණ වේ. විශේෂයෙන් ග්‍රාමීය මට්ටමින් ඉඩම් පරිහරණය සැලසුම් කිරීමේදීත්, ඉඩම් පරිහරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්පාදනයේදීත් මෙම ආයතනයේ කාර්යභාරය ඉතා වැදගත් වේ. එබැවින් දස වසරක් සම්පූර්ණ කරනු ලබන අවස්ථාවේදී මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සහ ඉදිරි වැඩපිළිවෙල පිළිබඳව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඒ. එස්. ඉලන්ගම්ගේ මහත්මිය සමග කරන ලද සංවාදයේදී ආයතනයේ කාර්යභාරය හා එහි ජාතික වැදගත්කම පිළිබඳ තවදුරටත් පැහැදිලි කරන ලදී.

***සංස්කාරක :* මෙම ආයතනය පිහිටුවා කොපමණ කාලයක්ද?**

***අධ්‍යක්ෂ ජනරාල්:*** සැබවින් ම මෙම ආයතනය මුලින්ම පිහිටුවා දැනට වර්ෂ 35 ක පමණ කාලයක් ගත වී තිබෙනවා. එවකට ඉඩම් අමාත්‍යංශයේ අංශයක් ලෙස සීමිත කාර්ය මණ්ඩලයක් සහිතව මෙය ක්‍රියාත්මක වුණා. නමුත් වරින් වර මෙම ආයතනයට නිලධාරීන් බඳවාගෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටම දක්වා මෙහි කාර්යයන් ව්‍යාප්ත වූ පසු එහි කාර්යභාරයේ වැදගත්කම සලකා මෙය දෙපාර්තමේන්තුවක් ලෙස 2010 වර්ෂයේදී උත්ශ්‍රේණිගත කළා. එලෙස දෙපාර්තමේන්තුවක් කර 2020 වනවිට වර්ෂ දහයක් සම්පූර්ණ වෙනවා.


***සංස්කාරක :* ඇත්තෙන් ම මෙම දෙපාර්තමේන්තුවෙන් සිදු කරන ලබන කාර්යභාරය කුමක්ද? ඒක සරළව පැහැදිලි කරන්න පුලුවන්ද?**

***අධ්‍යක්ෂ ජනරාල් :*** ඔව්. ඇත්තටම එය පැහැදිලි කිරීමට තිබෙන සරළම ක්‍රමය තමයි ඉඩම් භාවිතය සම්බන්ධයෙන් අප මුහුණපා ඇති ගැටළු සහ ඒවාට අපට ලබා දිය හැකි විසඳුම් පිළිබඳව සළකා බැලීම.

දැන් බලන්න රටක් වශයෙන් අපට ඉඩම් හිඟයක් තිබෙනවා. අපගේ විවිධ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට ඒ සඳහා සුදුසු ඉඩම් අවශ්‍ය ප්‍රමාණ වලින් රට තුළ දක්නට නැහැ. සමස්ත දිවයිනේ ම භූමි ප්‍රමාණය හෙක්ටයාර 6,561,000 නැතිනම් වෙනත් අයුරින් කිවහොත් වර්ග කිලෝමීටර් 65,610 ක්. නමුත් අපිට මේ සමස්ත භූමියම භාවිත කරීමේ හැකියාවක් නැහැ. දැනටමත් අප භූමියෙන් 51% ක් පමණ ගෙවතු, වැවිලි බෝග, කුඹුරු සහ අනෙකුත් වගාවන්ට භාවිතා කර තිබෙනවා. එමෙන් ම වනාන්තර, වන වගා, ලඳු කැලෑ තෘණ බිම් සඳහා භූමියෙන් 38% ක් පමණ භාවිතා කරලා. එහෙම බැලුවොත් අපි භූමියෙන් 89% ක් පමණ අපගේ ප්‍රධාන අවශ්‍යතාවලට දැනටමත් භාවිතා කර තිබෙනවා.ඉතිරි බිම් වලිනුත් ප්‍රපාතාකාර බෑවුම්, නිසරු බිම්, තෙත් බිම් සහ ජලාශවලට සැලකිය යුතු කොටසක් වෙන් වෙනවා. ඒ අනුව බැලූ විට මෙම ගැටලුව සරල නැහැ. නව ව්‍යාපෘති සඳහා අවශ්‍ය බිම් සපයා ගැනීම දුෂ්කරයි. අනෙක් අතට එහෙම ගැටලුවක් තිබියදීත් අප සමහර කාර්යයන් වලදී ඉඩම් විනාශ වී යන ආකාරයෙනුත් කටයුතු කරනවා. වෙනත් විදිහකට කියනවා නම් සැලසුමකින් තොරව අපගේ භූමිය භාවිතා කිරීමට අප පෙළඹී සිටිනවා. මෙය කොතරම් කාලයක් ඉදිරියට කර ගෙන යාමට පුළුවන් වේ දැයි අප දන්නේ නැහැ. ඉතින් මේ සඳහා ක්‍රමවත් සැලසුමකට අනුව ඉඩම් භාවිතා කළ යුතුයි. ඇත්තෙන්ම දැනට ඉඩම් පරිහරණය කර ඇති ආකාරය ගැන විමර්ශනය කර, ඒවායේ ඵලදායීතාවය වැඩි කිරීමට සැලසුම් කිරීම ප්‍රමුඛ කාර්යක් වෙනවා. ඒ සඳහා අප සැලසුම් සකස් කළ යුතු වෙනවා. මුළු රටේ ම ඉඩම් භාවිතය විධිමත් කිරීමට තනි සැලැස්මක් සැකසීම අපහසුයි. එමෙන් ම සැලසුම්කරණයේදී විවිධ අරමුණු තිබීමටත් පුළුවන්.

6 පිටුවට.....

# ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ දස වසරක පිය සටහන්




## Land Use Policy Planning Department Milestones of the Decade (2010 – 2019)

### 2010

1) On the request of Board Of Investment Sri Lanka (BOI), the Department had identified about 33,752 ha of unused state lands which are having a potential for development in Trincomalee, Batticaloa, Ampara, Jaffna, Mannar and Vavuniya districts.

2) On the request of Tourism Development Authority, the Department had identified 06 potential sites for tourism development activities along the A-9 road in Anuradhapura, Vauniya, Kilinochchi and Mullativu districts.

3) "Daduru Oyata Hetak" a river bank conservation project in Chilaw Divisional Secretariat Division was implemented as a pilot project

4) Kospothu Oya Kotan ganga Projects in Kandy district were successfully completed .

5) Based on the request made by Divisional Secretaries 2319 land suitability reports were provided.

### 2011

1) In Trincomalle and Batticaloa districts approximately 31,000 ha of lands which can be used as pasture lands were identified based on the request made by Ministry of Lands.

2) Based on the request made by Divisional Secretaries 1629 land suitability reports were provided.

### 2012

1) Preparing District Land Use Plan

Based on the recommendations given by the Lessons Learnt and Reconciliation Commission (LLRC), preparations of district land use plans for the 8 districts in the Northern & Eastern Provinces were commenced.

2) Selected area of Kelani River Bank has been conserved by using bio-engineering technology with the finical assistance of Ministry of Environment & Renewable Energy.


3) Based on the request made by Divisional Secretaries 1388 land suitability reports were provided.

### 2013

1) National Policy for the Protection and Conservation of water sources and their catchments and Reservations had been prepared based on the request made by Parliament Advisory Committee.
2) Suitable lands for rubber cultivation were identified in Ampara district as requested by District Secretary.

**To 3 rd page……**

# CONTRIBUTION OF LAND USE POLICY PLANNING DEPARTMENT FOR SUSTAINABLAE DEVELOPMENT GOALS



## ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනය කෙරේ.

මුල් පිටුවෙන්......

එහිදී ඉතා වැදගත් යෝජනා ඉදිරිපත් වූ අතර, එම යෝජනා ද සැලකිල්ලට ගෙන සංශෝධනය කරන ලද කෙටුම්පත ජනවාරි මස අවසානයේදී නැවත සාකච්ඡාවට බඳුන් කිරීමටත්, ඉන්පසු සියලුම සංශෝධන ඇතුළත් කර මහජන අදහස් ලබා ගැනීමටත් සැලසුම් කර ඇත. එලෙස මහජන අදහස් ලබා ගැනීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන **2020** වර්ෂයේ මැයි මසදී පමණ සංශෝධිත ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය එළි දැක්වීමට අපේක්ෂා කෙරේ.



වැඩමුළුවේ අවස්ථාවක්

## 2018 භූමි පරිහරණ හා භූමි ආවරණ තොරතුරු ප්‍රකාශයට පත් කෙරේ.

මුල් පිටුවෙන්......

මෙම ප්‍රකාශනයේ එක පිටපතක් අදාළ පාර්ශවකාර ආයතන වෙත නොමිලේ ලබා දුන් අතර, අමතර පිටපත් අවශ්‍ය වන ආයතන වලට ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ නාරාහේන්පිට පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් මිලදී ගැනීමේ පහසුකම් සලසා ඇත.



සම්මන්ත්‍රණයට සහභාගි වූ විද්වත් මණ්ඩලය

**From 3 rd. Page;**

3) On the request of Ministry of Livestock Development, suitable lands for grazing were identified in Ampara and Batticaloa districts.

4) On the request of Ministry of Sugar Industry, suitable lands for Sugar cane cultivation were identified in Ampara and Batticaloa districts.

5) Attanagala Oya River Bank Conservation Project was carried out in Gampaha district.

6) Identified unused state lands in Plantation sector.

7) On the request of Ministry of Plantation Industries, tea, rubber and oil palm cultivated lands were mapped using GIS technique in Kalutara, Galle, Ratnapura, Kegalle Kandy and Matara districts

8) Based on the request made by Divisional Secretaries 3566 land suitability reports were provided.

9) Process of preparations of district land use plans for the 8 districts in the Northern & Eastern Provinces was being continued.

**2014**

1)Land Capability Classification of paddy lands in Kesbewa, Homagama and Padukka Divisions in Clombo district was carried out as a pilot study with the collaboration of Hector Kobbakaduwa Agrarian Research & Training Institute.

2) A special study was conducted to identify the abandoned paddy lands in Galle district

3) Implementation of a project to map the land uses and to identify environmental issues in the Kelani River Basin.

4) Contribution was given to prepare National Action Plan of Haritha Lanka Programme.

5) Contribution was made to prepare Ten Year National Action Plan (2015 – 2024) to mitigate the Land Degradation.

6) Based on the request made by Divisional Secretaries 1314 land suitability reports were provided.

**2015**

1) Mapping of areas under plantation crops had been carried out in Kalutara, Galle, Rathnapura, Nuwaraeliya, Kegalle and Kandy Districts.

2) Mapping of land use and environmental issues in the Kelani river basin carried out based on the request made by Ministry of Environment.

3) Assisted to Land Resources Division of the Ministry of Environment to prepare Ten year National Action Programme(2015-2024) to combat the land degradation.

4) National Tree Planting Program named "Vanaropa" had been carried out by the department in 18 districts.

**2016**

1) Preparation of a Land Use Plans for Kala Oya river basin to conserve the bio-diversity and ensure the sustainability of eco-system services was commenced with the financial assistance from Ministry of Environment and UNDP.

2) Preparation of Land capability maps and classification of lands in the Welioya catchment was carried out with the financial assistance from Ministry of Environment.

**To 8 th page......**

2 පිටුවෙන්......

උදාහරණ ගතහොත් යටිතල පහසුකම් සංවර්ධනය, පරිසර සංරක්ෂණය, කෘෂි ඵලදායිතා ප්‍රවර්ධනය, ජෛව විවිධත්ව සංරක්ෂණය වැනි විවිධ අරමුණු ඉලක්ක කර ඉඩම් පරිහරණ සැලසුම් සැකසිය හැකියි. ඒ වගේ ම මෙම සැලසුම් විවිධ මට්ටම් වලින් සැකසිය හැකියි. ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා ජාතික, පළාත්, දිස්ත්‍රික් වැනි ඉහළ මට්ටම් වලිනුත්, සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය, ග්‍රාමීය හෝ ඒ හා සමාන මට්ටම් වලින් සැලසුම් සැකසීම කළ යුතු වෙනවා. අපි ප්‍රාදේශීය, ග්‍රාමීය සහ ක්ෂුද්‍ර ජල පෝෂක වලින් සැලසුම් සැකසීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර තිබෙනවා.

***සංස්කාරක : දැනට මේ වෙද්දී එවැනි සැලසුම් කොපමණ ප්‍රමාණයක් සකස් කර තිබෙනවාද?***

***අධ්‍යක්ෂ ජනරාල් :*** අප නව ක්‍රමවේදයකට අනුව ප්‍රාදේශීය සැලසුම් සැකසීම 2009 වර්ෂයේදී ආරම්භ කළා. ඒ අනුව මේ වන විට ප්‍රාදේශීය සැලසුම් 318 ක් නිම කර තිබෙනවා. ඒ සමගම උතුරු නැගෙනහිර පළාත්වල දිස්ත්‍රික් සඳහා දිස්ත්‍රික් සැලසුම් 08 ක් 2016 වර්ෂයේදී නිම කර අදාළ දිස්ත්‍රික් ලේකම් වරුන්ට භාර දී තිබෙනවා. ඒ වගේ ම ජනතාවගේ සහභාගිත්වය ඇතිව ග්‍රාමීය හා ක්ෂුද්‍ර ජල පෝෂක සැලසුම් 450 ක් පමණ නිම කර තිබෙනවා.

***සංස්කාරක : සංඛ්‍යාත්මකව බැලූ විට එම සැලසුම් ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයක්. මෙම සැලසුම් ක්‍රියාත්මක වීම මේ වන විට සිදුවෙනවාද?***

***අධ්‍යක්ෂ ජනරාල්:*** අපට මෙම සැලසුම් ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් සියට සීයක්ම සෑහීමකට පත්වෙන්න බැහැ. නමුත් යම් සාධනීය මට්ටමකින් මේවායේ ඇති සමහර යෝජනා ක්‍රියාත්මක කර තිබෙනවා. විශේෂයෙන් ග්‍රාමීය මට්ටමේ ඇති සැලසුම්වල නිර්දේශ ක්‍රියාමක කිරීම හොඳ මට්ටමක පවතිනවා. ඇත්තටම මෙම දෙපාර්තමේන්තුවට මෙම සැලසුම් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නැහැ. ඒ සඳහා විවිධ පාර්ශවකාර ආයතන දායක විය යුතුයි. එබැවින් අප හැකි සෑම විට ම මෙම සැලසුම් පිළිබඳව පාර්ශවකාර ආයතන දැනුවත් කිරීමට කටයුතු කරනවා. ඒ වගේම මේ අවස්ථාවේදී මම ඉල්ලීමක් කරන්න කැමතියි , විවිධ ව්‍යපෘති සහ වැඩසටහන් සඳහා ඉඩම් පරිහරණ සැලසුම් අවශ්‍ය වන අවස්ථා වලදී අපගේ සැලසුම් ලබා ගෙන ඒවා ප්‍රයෝජනයට ගන්නා ලෙස. එමෙන් ම එම ව්‍යපෘති හෝ වැඩසටහන්වල අරමුණු වලට ගැලපෙන ලෙස අපගේ සැලසුම් වලට යම් සංශෝධන හෝ වැඩිදියුණු කිරීම් අවශ්‍ය වන්නේ නම් එවැනි වැඩි දියුණු කිරීම් සිදු කිරීමත් කළ හැකියි. එවැනි දේ තුලින් අපගේ සැලසුම්වලට ඇති ඉල්ලුම වැඩි කිරීමට හැකි වේවි.

***සංස්කාරක : මෙම සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා නීතිමය රාමුවක් තිබුණොත් වඩාත් හොඳයි නේද? එලෙස නීතිමය රාමුවක් නොමැතිකම බලවත් අඩුවක් නේද? එම අඩුව සපුරාගන්නේ කෙසේද?***

***අධ්‍යක්ෂ ජනරාල්:*** රටේ ඉඩම් පරිහරණ කටයුතු විධිමත් කිරීමට ඒ සඳහාම වෙන් වූ පනතක් තිබීම හොඳයි. අපි ඒ සඳහා යම් උත්සාහයක් ගත්තා. නමුත් යම් තාක්ෂණික ගැටළු නිසා එය සාර්ථක වුයේ නැහැ. නමුත් අප තවමත් ඒ සඳහා උත්සාහ ගනිමින් සිටිනවා. එසේ වුවත්, දැනට ඇති අණ පනත්වල ඉඩම් භාවිතය විධිමත් කිරීම සඳහා යම් යම් ප්‍රතිපාදන තිබෙනවා. ඉඩම් විෂය සැලකූ විට මාගේ දැනීමේ හැටියට පනත් පනහකට ආසන්න සංඛ්‍යාවක් තිබෙනවා. මේ අතුරින් සමහර පනත්වල ඉඩම් පරිහරණය විධිමත් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන තිබෙනවා. උදාහරණ ලෙස දක්වතොත් ජාතික පාරිසරික පනතේ ඉඩම් පරිහරණ සැලසුම්කරණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සහ මග පෙන්වීම් තිබෙනවා. මෙම පනත් බලාත්මක කිරීමේ යම් අඩු පාඩු තිබෙන්න පුළුවන්. ඒ අඩු පාඩු හඳුනාගෙන ඒවා මගහැර ගැනීමෙන් දැනට තිබෙන නීතිමය ප්‍රතිපාදන භාවිතා කරන්නත් හැකියාව තිබෙනවා. නමුත් තිබෙන පනත්වල ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා වන ආයතන නම්කර තිබෙන බැවින් •, මෙම ආයතනයෙන් සිදු කරනු ලබන කාර්යයන් සඳහා වෙන ම පනතක් තිබීම වැදගත්.කෙසේ වුවත්, අප මේ අවස්ථාවේදී වැඩි අවධානයක් ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය කෙරෙහි යොමුකර එය අදට ඔබින ලෙස සංශෝධනය කිරීම ආරම්භ කර තිබෙනවා.

***සංස්කාරක : එය කාලීන වශයෙන් හොඳ අදහසක් බව මගෙත් හැඟීමයි. ඒ පිළිබඳව තවදුරටත් පැහැදිලි කරන්න පුලුවන්ද?***

***අධ්‍යක්ෂ ජනරාල් :*** දැනට තිබෙන ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය 2007 වර්ෂයේදී සම්මත කරන ලද්දක්. එය නැවත පරික්ෂාකර බැලීමේදී එහි ඇති සමහර ප්‍රතිපත්තිමය කරුණු අදට ගැලපෙන ලෙස වෙනස්විය යුතු බව අපට වැටහුණා. ඒ අනුව අප 2018 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී මෙම ප්‍රතිපත්තිය සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගත්තා. දැනට සියලු පාර්ශවකාර ආයතනවල දායකත්වය ලබා ගනිමින් ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමේ කටයුතු ආරම්භ කර තිබෙනවා. සංශෝධිත ප්‍රතිපත්තිය එළි දැක්වීම ලබන වසරේ මැයි මාසය වන විට පමණ සිදු කිරීමටයි අපගේ බලාපොරොත්තුව. මෙහිදී අප බලාපොරොත්තු වෙනවා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන උපාය මාර්ග ප්‍රතිපත්තිය සමගම ඉදිරිපත් කිරීමට. එය අපගේ දෙපාර්තමේන්තුවට මෙන් ම අනකුත් පාර්ශවකාර ආයතනවලට රටේ ඉඩම් භාවිතය විධිමත් කිරීමේ සඳහා වන මාර්ගෝපදේශයක් වේවි.

***සංස්කාරක: දෙපාර්තමේන්තුවේ ඉදිරි සැලසුම් ගැන පැහැදිලි කිරීමක් කළොත්.***

***අධ්‍යක්ෂ ජනරාල් :*** අපට වාර්ෂිකව සීමිත මූල්‍ය ප්‍රතිපාදනයක් තමයි ලැබෙන්නේ. ඒ අනුව තමයි අපගේ වාර්ෂික වැඩසටහන් සැලසුම් කළ යුතු වෙන්නේ. කලින් සඳහන් කල ආකාරයට දැනට අපි වැඩි අවධානයක් ග්‍රාමීය මට්ටමේ සහ ක්ෂුද්‍ර ජල පෝෂක මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම කෙරෙහි යොමු කර තිබෙනවා. මෙහි විශේෂත්වය තමයි එම සැලසුම්කරණය ප්‍රජාව සහභාගිකරගෙන සිදු කිරීම. එය වඩාත් සාර්ථක බව අපට වැටහී තිබෙනවා. මෙම සැලසුම්කරණය තව දුරටත් ඉදිරියට කරගෙන යාමට අදහස් කරගෙන් සිටිනවා. එමෙන්ම භූමි පරිහරණ හා භූමි ආවරණ තොරතුරු වර්ෂ පහකට වරක් යාවත්කාලීන කිරීම අපගේ අපේක්ෂාවයි. මෙම ආයතනයේ ඉතිහාසයේ ප්‍රථම වතාවට භූමි පරිහරණ තොරතුරු 2019 ප්‍රකාශනයක් ලෙස එළි දැක්වීම සිදු කළා. ලබන වර්ෂයේ නැවත වරක් එම තොරතුරු යාවත්කාලීන කිරීම ආරම්භ කිරීමට සැලසුම් කර තිබෙනවා. ලංකාවේ සියලු දිස්ත්‍රික්ක ආවරණය වන ලෙස මෙය සිදු කර ප්‍රකාශනයක් ලෙස එළි දැක්වීමට වර්ෂ පහක පමණ කාලයක් ගතවෙනවා. ඒ වගේ ම සැලසුම්කරණ අත්දැකීම් උපයෝගී කරගෙන කුඹුක්කන් ඔය ද්‍රෝණිය සඳහා ඉඩම් පරිහරණ සැලසුමක් සැකසීමටත්, කෘෂි පාරිසරික කලාප තුනට අයත් දිස්ත්‍රික්ක තුනක නියමු වැඩසටහනක් ලෙස ඉඩම් වර්ගීකරණයක් සිදු කිරීමටත් බලාපොරොත්තු වෙනවා. එමෙන් ම ඌන පරිහරණ කෘෂිකාර්මික බිම්වල පාංශු සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමත් සිදු කිරීමට සැලසුම් කර තිබෙනවා. ඒ වගේ ම අර්ධ වාර්ෂිකව දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳ දැනුවත් කිරීමට පුවත් සංග්‍රහයක් එළි දැක්වීමටත් සැලසුම් කර තිබෙනවා. මෙය එහි මංගල කලාපයයි. 2019 වර්ෂයේදී අපගේ නිලධාරීන් විසින් සිදු කළ පර්යේෂණ වලින් තෝරාගත් පර්යේෂණ කිහිපයක් ශාස්ත්‍රීය සම්මන්ත්‍රණයක් පවත්වා ඉතාමත් සාර්ථක ලෙස එළි දැක්වීම සිදු කළා. එවැනි පර්යේෂණ තව දුරටත් සිදු කිරීමටත් ඒවා එළි දැක්වීමටත් අපි අපේක්ෂා කරනවා. ඒ තුලින් අපගේ සැලසුම්කරණ ක්‍රමවේද විද්‍යාත්මක පදනමකින් වැඩි දියුණු කිරීමට මෙම සොයා ගැනීම් යොදා ගැනීමට උත්සාහ දරනවා. ඒ වගේ ම විවිධ ව්‍යාපෘති වල ඉල්ලීම් මත ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සිදු කර තිබෙනවා. එවැනි කාර්යයන් ඉදිරියටත් සිදු කිරීමට බලාපොරොත්තු වෙනවා.

***සංස්කාරක : සීමිත සම්පත් මත විශාල වැඩ කොටසක් සැලසුම් කර තිබෙන බව පේනවා. මේ සියලු දේ සාර්ථකව කළමනාකරණය කර ගැනීමට පුලුවන්ද?***

***අධ්‍යක්ෂ ජනරාල් :*** ඇත්තට ම මෙය දුෂ්කර කාර්යයක්. නමුත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ, දිස්ත්‍රික් කාර්යාලවල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති අපගේ නිලධාරීන්ගේ කැපවීම නිසා අපේක්ෂිත කටයුතු ඉටු කර ගැනීමට හැකි වෙන බව මගේ විශ්වාසයි. ඒ වගේ ම මෙම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා හැකි සෑම අවස්ථාවකදී ම ඔවුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය සඳහා පුහුණු කිරීම අඛණ්ඩව සිදු කරනවා. විශේෂයෙන් තාක්ෂණික කාර්යයක නියැළී සිටින නිලධාරීන් වශයෙන් ඔවුන්ව අඛණ්ඩව පුහුණු සඳහා යොමු කළ යුතු වෙනවා.

## காணி உபயோகக் கொள்கைத் திட்டமிடல் திணைக்களம் கடந்து வந்த பாதை

இலங்கையில் நில வள மேம்பாட்டுக்கான அறிவியல் அளவுகோல்களின் அடிப்படையில் காணிப் பயன்பாட்டுத் திட்டமிடுதலுக்கான விரிவான அணுகுமுறையை பின்பற்றுவதற்கான நோக்கத்துடன் 1982 ஆம் ஆண்டில் உணவு மற்றும் விவசாய அமைப்பின் உதவியுடன் அப்போதைய காணி மற்றும் காணி அபிவிருத்தி அமைச்சின் கீழ் காணி உபயோகக் கொள்கைத் திட்டமிடல் பிரிவு நிறுவப்பட்டது. பின்னர் மாவட்டங்களுக்கு நடவடிக்கைகளை விரிவுபடுத்துவதற்காக 1987 ஆம் ஆண்டில் காணிப் பயன்பாட்டு திட்டமிடல் திட்டத்தின் கீழ் ஆசிய அபிவிருத்தி வங்கி உதவி பெறப்பட்டது.

குறிக்கோள்களை அடைவதற்காக, ஒவ்வொரு மாவட்டத்திலும் 1988 ஆம் ஆண்டில் காணிப் பயன்பாட்டு திட்டமிடல் அலகுகள் நிறுவப்பட்டு காணிப் பயன்பாட்டு திட்டமிடல் உத்தியோகத்தர்கள் ஆட்சேர்ப்பு செய்யப்பட்டனர். காணிப் பயன்பாட்டு திட்டமிடல் உத்தியோகத்தர்களுக்கு வெளிநாட்டு மற்றும் உள்ளூர் ஆலோசகர்களால் சிறப்பு தொழில்நுட்ப பயிற்சி வழங்கப்பட்டது.

1994 மற்றும் 1999 ஆம் ஆண்டுகளில், பட்டதாரி வேலைவாய்ப்பு திட்டத்தின் கீழ், 62 பட்டதாரிகள் உதவி காணிப் பயன்பாட்டு திட்டமிடல் அலுவலகர்களாக மாவட்ட காணிப் பயன்பாட்டு திட்டமிடல் அலுவலகங்களில் இணைக்கப்பட்டார்கள். 2005ஆம் ஆண்டில், 269 பட்டதாரிகள் காணிப் பயன்பாட்டு திட்டமிடல் உதவியாளர்களாக ஆட்சேர்ப்பு செய்யப்பட்டு பிரதேச செயலாளர் பிரிவுகளுடன் இணைக்கப்படடார்கள்.. இந்த அலுவலர்களின் பதவி 2014ஆம் ஆண்டில் காணிப் பயன்பாட்டு திட்டமிடல் அலுவலர்களாக மாற்றப்பட்டுள்ளது. அத்தோடு, 2013 மற்றும் 2014 ஆம் ஆண்டுகளில் பட்டதாரி வேலைவாய்ப்பு திட்டத்தின் கீழ் 176 பட்டதாரிகள் அபிவிருத்தி உத்தியோகத்தர்களாக நியமிக்கப்பட்டுள்ளனர்.

**From 6th page.:**

3) Re-engineering of land use planning processes were initiated with the guidance of ICTA

4) Implementation of selected activities under "Punarudaya" Program were carried out with the financial assistance from presidential secretaries through the Ministry of Environment. Under this program 44 Divisional Secretariat Divisions in 11Districts were selected in order to implement the activities to protect and conserve the lands and improve the land use. In addition, Rs.5mn had been allocated to Ratnapura District for "Punarudaya" (National Environment Programs).

5) Prepared district land use plans for the 8 districts in the Northern & Eastern Provinces and handed over to Ministry & respective District Secretaries.

6) Based on the request made by Divisional Secretaries 1388 land suitability reports were provided

**2017**

1) Funds provided by the Presidential Secretariat under the "Punarudaya" Program some activities have been initiated for environmental conservation. Allocation has been given to 217 projects in 23 districts for the conservation and protection of lands and to implement the proposals for the improvement of land use. Under this program several soil and water conservation programs in environmental sensitive areas and programs to protect water sources were implemented.

2) Prepared Land capability maps and classified lands in the Welioya catchment with the financial assistance from Ministry of Environment

3) Re-engineering of land use planning processes was continued with the guidance of ICTA.

4) Preparation of participatory land use planning guidelines to minimize the degradation of agricultural lands in selected sub watersheds in Kandy, NuwaraEliya, and Badulla districts under the financial assistance from FAO was initiated.

காணிப் பயன்பாட்டு திட்டமிடல் விடயத்தின் விரிவாக்கம் மற்றும் பங்கு மற்றும் பொறுப்புகளின் விரிவாக்கம் காரணமாக, இந்த பிரிவு 2010இல் ஒரு திணைக்களமாக தரமுயர்த்தப்பட்டது.

மாவட்ட காணிப் பயன்பாட்டு திட்டமிடல் உத்தியோகத்தர்கள் 2015 இல் உதவி பணிப்பாளர் (மாவட்ட காணிப் பயன்பாடு) ஆக நியமிக்கப்பட்டார்கள். 2016ம் ஆண்டு வெற்றிடமாகவிருந்த 11 உதவிப் பணிப்பாளர் (மாவட்ட காணிப் பயன்பாடு) பதவிகளுக்கு ஆட்சேர்ப்பு செய்யப்பட்டது.

திணைக்களத்தின் சுமூகமான செயல்பாட்டிற்காக அங்கீகரிக்கப்பட்ட பணியாளர்கள் 697 ஆக அதிகரிக்கப்பட்டுள்ளது. தற்போது இந்த திணைக்களத்தில் 636 ஊழியர்கள் பணியாற்றி வருகின்றனர்.

தேசிய மட்டத்தில் உள்ள அனைத்து நடவடிக்கைகளும் தலைமை அலுவலகத்தில் பல்வேறு பிரிவுகளின் பணிப்பாளர்கள், பிரதிப் பணிப்பாளர்கள், உதவிப் பணிப்பாளர்கள் (நிர்வாகம், காணிப் பயன்பாட்டு திட்டமிடல், பயிராக்கவியல், விவசாய பொருளியல், சமூகவியல் மற்றும் தகவல் முறைமை) ஆகியோரின் உதவியுடன் பணிப்பாளர் நாயகத்தினால் ஒருங்கிணைக்கப்பட்டு கையாளப்படுகின்றன.

காணிப் பயன்பாட்டு திட்டமிடல் நடவடிக்கைகள் தலைமை அலுவலகம் வழங்கும் வழிகாட்டுதலின் படி மாவட்ட மற்றும் பிரதேச மட்டங்களில் இணைக்கப்பட்டுள்ள காணிப் பயன்பாட்டு திட்டமிடல் அலுவலகர்கள் அல்லது அபிவிருத்தி உத்தியோகத்தர்களால் மேற்கொள்ளப்படுகின்றன மற்றும் அனைத்து நடவடிக்கைகளும் உதவிப் பணிப்பாளர் (மாவட்ட காணிப் பயன்பாடு) இனால் மேற்பார்வையிட்டு கண்காணிக்கப்படுகின்றன

**2018**

1) Punarudaya program was implemented with financial contribution of Presidential Secretariat. Under this program an Action Plan was prepared to implement the soil and water conservation and conserve the water sources. This programme was implemented in 10 districts with the allocation of Rs. 31.3 m in 2018. .Under this programme, watersheds, river banks, tank reservations, home gardens and other agricultural lands were conserved successfully by introducing soil conservation measures in Kandy, Matale, Nuwara Eliya, Ratnapura, Kegalle, Badulla, Monaragala, Gampaha, Matara and Kalutara districts.

2) Preparation of land restoration plans for selected micro watersheds and formulation of participatory land use planning guidelines under degraded agricultural lands rehabilitation project was continued.

3) Based on the request made by Divisional Secretaries 1003 land suitability reports were provided.

4) Digital data provided on the request of Government Institutions (21) Universities (19 studies) and for Projects (10)

5) Preparation of village and micro watershed level land use plans through participatory approach were carried out.

**2019**

1) Punarudaya program was implemented in with financial contribution of Presidential Secretariat. There are 47 programme was implemented in 07 districts.

2) Preparation of land restoration plans for selected micro watersheds under Degraded agricultural lands rehabilitation project was continued.

3) National programme for strengthening disable adults in the community. This programme implemented 04 districts. The President Secretariat funded for this programme.

4) Preparation of village and micro watershed level land use plans through participatory approach were continued

5) Process of amending of National Land Use Policy has been initiated.

6) Symposium on land use studies was conducted